අධ්‍යක්ෂ,
විභාග කොට්ඨාසය ගෙන්

INFORMATION TECHNOLOGY DIVISION
MAY 2021
POLICE HEADQUARTERS

අණදෙන නිලධාරීන් සහ
සියලුම කොට්ඨාසභාර නිලධාරීන් වෙත,
(ක්‍රියාකාරී සහ ක්‍රියාකාරී නොවන)
අංශ ප්‍රධානි, ආයතන (ඊයු) අංශය.

## ආධුනික උප පොලිස් පරීක්ෂක , ආධුනික පොලිස් කොස්තාපල් නිලධරයන් සහ ආධුනික පොලිස් කොස්තාපල් රියදුරන් ගේ සේවය ස්ථිර කිරීමේ භාෂා, ප්‍රථමාධාර හා පිහිණුම් පරීක්ෂණ

පොලිස්පති චක්‍රලේඛ අංක 2021/2007 හා ආයතන චක්‍රලේඛ අංක 25/2007 අනුව ආධුනික උ.පො.ප./ කා.උ.පො.ප., ආධුනික පො.කො./ කා.පො.කො. නිලධරයන් සහ ආධුනික පො.කො.රි. වරුන්ගේ සේවය ස්ථිර කිරීමේ 2021 දෙවන කාර්තු පරීක්ෂණය පැවැත්වීමට මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. **සුදුසුකම්**

2021.06.30 දිනට මාස 33 ක සක්‍රීය සේවා කාලය සම්පූර්ණ වන ආධුනික උ.පො.ප./ කා.උ.පො.ප., පො.කො./ කා.පො.කො. නිලධරයන්, පො.කො.රි. නිලධාරීන් සහ දැනටමත් මෙම පරීක්ෂණය සඳහා පෙනී සිට අසමත් වූ නිලධරයන් මේ සඳහා සුදුසුකම් ලබයි.

02. **විෂය පථය**

අයදුම්කරුවන්/ කාරියන් පහත සඳහන් විෂයයන් යටතේ ලිඛිත හා ප්‍රායෝගික වශයෙන් පරීක්ෂණ සඳහා පෙනී සිටිය යුතුයි.

ලිඛිත පරීක්ෂණය පහත සඳහන් විෂයයන් යටතේ පැවැත්වේ.

1 සිංහල විෂයය - (දෙමළ ප්‍රථම භාෂාව වන නිලධරයන් සඳහා)
2 දෙමළ විෂයය - (සිංහල ප්‍රථම භාෂාව වන නිලධරයන් සඳහා)
3 ඉංග්‍රීසි විෂයය - (**පො.කො.රි. නිලධාරීන් හැර** සියලුම නිලධරයන් සඳහා)
4 ප්‍රථමාධාර විෂයය - (සියලුම නිලධරයන් සඳහා)

වාචික පරීක්ෂණය.

1 සිංහල විෂයය - (දෙමළ ප්‍රථම භාෂාව වන නිලධරයන් සඳහා)
2 දෙමළ විෂයය - (සිංහල ප්‍රථම භාෂාව වන නිලධරයන් සඳහා)
3 ඉංග්‍රීසි විෂයය - ( **පො.කො.රි. නිලධාරීන් හැර** සියලුම නිලධරයන් සඳහා)
4 ප්‍රථමාධාර විෂයය - (සියලුම නිලධරයන් සඳහා)

ප්‍රායෝගික පරීක්ෂණය.

1 පිහිණුම් හා ජීවිතාරක්ෂක විෂයය - (සියලුම නිලධරයන් සඳහා)

03. **විභාගය පැවැත්වීම.**

විභාග කොට්ඨාසය මගින් නම් කරන ස්ථානයකදී හෝ ස්ථාන කිහිපයකදී මෙම කාර්තු පරීක්ෂණය පැවැත්වීමට කටයුතු කරනු ඇත.

→

04. **අයදුම්පත්‍ර**

1. මෙම උපදෙස් පත්‍රිකාව සමඟ ඉදිරිපත් කෙරෙන ආදර්ශ අයදුම්පත්‍රයට අනුව අයදුම්කරුවන් විසින් A- 4 ප්‍රමාණයේ කොලයක සකස් කරගත් අයදුම්පතක අදාල විස්තර ඇතුලත් කොට ඉදිරිපත් කල යුතුයි.
2. සේවා කඩවීම් ඇති නිලධරයන්ගේ සේවා ලේඛනයේ ඒ සම්බන්ධව සටහන් කර ඇති පිටුවේ සහතික කල පිටපතක් යාකර එවීමට කටයුතු කරන්න. (සේවා ලේඛනයේ 22 පිටුව)
3. සෑම අයදුම්පත්‍රයක්ම කොට්ඨාසභාර නිලධාරියා මගින් ආවරණ ලිපියක් සහිතව අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාරදිය හැකිය. (කොට්ඨාසයට අයත් සෑම අයදුම්පත්‍රයක්ම වරින්වර ඉදිරිපත් නොකර එක්වර ඉදිරිපත් කිරීමට කටයුතු කරන්න.)
4. අපැහැදිලි, අසම්පූර්ණ හෝ කොට්ඨාසභාර නිලධාරියාගේ නිර්දේශය නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

05. **අයදුම්පත් භාර ගැනීම**

**2021.06.04** දිනට පෙර **අධ්‍යක්ෂ, පොලිස් විභාග කොට්ඨාසය, බිම් මහල, අංක 234, චොක්ෂෝල් වීදිය, කොළඹ 02** ලිපිනය වෙත අයදුම්පත් ඉදිරිපත් කළ යුතුයි. මෙදිනෙන් පසු ලැබෙන අයදුම්පත්‍ර කුමන හේතුවක් මත හෝ භාර නොගන්නා හෙයින් ප්‍රතික්ෂේප කිරීමට සිදුවන බව අවධාරණය කරමි. (ප්‍රමාදවී අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් විභාගය සඳහා පාසැල්වල ඉඩ පහසුකම් වෙන්කරවා ගැනීමේදී ගැටළු ඇතිවන බැවින් නියමිත දිනට පෙර අයදුම්පත් ඉදිරිපත් කිරීමට කටයුතු කරන්න.)

06. **විභාග ප්‍රවේශ පත්‍ර**

1. විභාග ප්‍රවේශපත්‍ර කොට්ඨාසභාර නිලධාරීන් මගින් අයදුම්කරුවන්ට භාරදීමට කටයුතු කරනු ඇත.

**සැලකිය යුතුයි.**

1. කොට්ඨාසය තුල සේවය ස්ථිර කිරීමේ කාර්තු පරීක්ෂණයට සුදුසුකම් ලබන නිලධරයන්ගේ ලේඛනයක් තබාගෙන ඒ අනුව අයදුම්පත් ඉදිරිපත් කිරීමට කටයුතු කරන්න.
2. ආධුනික ලිපිගොනු පරීක්ෂාකර සුදුසුකම් ලබන අයදුම්කරුවන්ගේ අයදුම්පත් පමණක් නියමිත දිනට පෙර ඉදිරිපත් කරන්න.
3. සුදුසුකම් නොලබන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් වලකින්න.
4. පසුගිය කාර්තු පරීක්ෂණ සඳහා යොමුකර ඇති අයදුම්පත්‍ර මෙම කාර්තුවට වලංගු නොවන බව දන්වා සිටිමි.

කේ.කේ. කිංස්ලි ගුණසේකර
ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි
අධ්‍යක්ෂ / පොලිස් විභාග කොට්ඨාසය
අංක. 234, චොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

කේ.කේ.කිංස්ලි ගුණසේකර,
ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි,
අධ්‍යක්ෂ,
පොලිස් විභාග කොට්ඨාසය.
2021.05. 13

**ස්ථානාධිපති./ තොරතුරු කාමරය.**

කරුණාකර මෙම පණිවුඩය අදාල කොට්ඨාස වෙත කඩිනමින් බෙහැර කිරීමට කටයුතු කරන්න.

17/05

පුද්ගලික සහකාර,
ජ්‍යෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති,
පරිපාලන

21/05/17
1329

පුද්ගලික සහකාර
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති
(පරිපාලන)